**ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.**

---

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** තත්ත්වාගණනය කළ මතය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන්ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 22 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 17 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) 1.6.1.(ආ) ඡේදයේ සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

**(අ) දේපල පිරියත හා උපකරණ**

------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ශේෂ 2021 ජනවාරි 01 දිනට එම ප්‍රකාශනයේ ආරම්භක ශේෂ සමඟ සැසඳීමේදී 2020 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල නමුත් සිගාස් පරිගණක මුද්‍රිත සටහනෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ එම මිලදී ගැනීම් 2020 වර්ෂයට සටහන් නොවී තිබීමත් , හඳුනාගත් වැරදි සටහන් පැවතීමත් හේතුවෙන් වත්කම් වර්ග 8 ක රු.1,230,892,660 **ක** වෙනසක් පැවතුණි. | මෙම වෙනසට හේතුව 2020 දෙසැම්බර් මාසයේදී මිලට ගෙන සිගාස් පරිගණක මුද්‍රිත සටහනේ ස්ථාවර වත්කම් යටතේ 2020 වර්ෂයට සටහන් නොවී තිබීමත් හඳුනාගත් වැරදි සටහන් තිබීමත් බව. | මිලදී ගැනීම් සියල්ල අදාල වර්ෂයට ගිණුම්ගත කල යුතු අතර මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

(ආ) **අත්තිකාරම් ගිණුම් ශේෂ**

--------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | පෙර වර්ෂයේ මුදලින් පියවන ලද අත්තිකාරම් ලැබීම්වල එකතුව ඇතුලත්කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ 2020 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇති වටිනාකම හා පසුගිය වර්ෂයේ අත්තිකාරම් ගිණුම අනුව එම වටිනාකම අතර රු. 1,326,759 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීමට අදාල පෙර වර්ෂයේ තොරතුරු සංසන්දනය කිරීමේදී මුදලින් පියවන ලද අත්තිකාරම් ලැබීම් වල එකතුව වන රු.1,326,761 ක වටිනාකම ඇතුළත් කර නොතිබීම මෙම වෙනසට හේතුවී ඇති බව. | අත්තිකාරම් ගිණුම හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වටිනාකම් සංසන්දනය කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආරම්භක ශේෂයන් සැසඳීමේදී හරස් සටහන්හි ශේෂය අත්තිකාරම් ගිණුම් ශේෂය තුල ඇතුලත් නොකිරිම නිසා අත්තිකාරම් ගිණුමේ රු. 6,975,956 ක වෙනසක් හා භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් වල රු. 6,975,956 ක වෙනසක් පැවතුණි. | 2020 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ පිළියෙළ කිරීමේදී 215012 හි ශේෂය අත්තිකාරම් ගිණුම් ශේෂය තුල ඇතුළත් නොකිරීමත් 2021 වර්ෂයේදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය පිළියෙළ කිරීමේදී 215011හි ශේෂය හා 2115012 හි ශේෂය යන ශේෂ දෙකම ඇතුළත් කිරීම මෙම වෙනස හේතු වී ඇති බව. | නිවැරදි අගයන් ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප ලබා ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |

### 1.6.3 විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ ජපානයේ පැවති කාර්මික පුහුණු උපදේශකවරුන් සඳහා වූ ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන සඳහා ශිෂ්‍යත්ව ලාභීන් තෝරා ගැනීම සම්බන්ධ ලිපිගොනුව විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | ලිපිගොනුව පිළිබඳව නිවැරදි තොරතුරු සොයා ගැනීමේ අපහසුතාවයක් පවතින බව. | විගණනයට අවශ්‍ය ලිපි ගොනු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 තැන්පතු ගිණුම් ශේෂ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන පොදු තැන්පතු ගිණුම් 03 හි සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 2 ඉක්මවූ රු 23,511,236 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ශේෂ පරික්ෂා කර නිරවුල් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට බැරකල යුතු වර්ෂ 2015-2018 කාලපරිච්ඡේදයට අයත් රු.54,680 ක මුදලක් අදාල අරමුදලට බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන පැවතුණි. | කම්කරු දෙපාර්තමේන්තුව වෙත යවන තෙක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ඇති බව. | කම්කරු දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් යැවීම සඳහා අවශ්‍ය කටයුතු යෙදිය යුතුය. |
| (ඇ) | නිකුත් කල නමුත් මාස 06 කට වඩා වැඩි කාලයක් තුළ ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ වටිනාකම රු. 1,099,174 ක චෙක්පත් 03 ක් 2015 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි. | පවතින ශේෂය ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු යෙදිය යුතු බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | 2018 ජනවාරි සිට හඳුනා නොගත් ලැබීම් අවස්ථා 5 කට අදාල එකතුව රු.232,560 ක් හා 2019 දෙසැම්බර් සිට බැංකු ගත කල නමුත් උපලබ්ධි නොවූ රු. 29,800 ක් වටිනා චෙක්පත් 02 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | හඳුනා නොගත් ලැබීම් හා බැංකු ගත කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් වසර 02 ක ඉක්මවා නොමැති බැවින් රඳවා තබාගෙන ඇති බව. | හඳුනා නොගත් ලැබීම් හඳුනා ගැනීමටත් බැංකුවේ තැන්පත් කල චෙක්පත් උපලබ්ධි නොවීමට අදාලව මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 214 ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අතර කාලපරිච්ඡේදයේ පැවති අවස්ථා 39 කට අදාල රු. 5,555,206 ක බැරකම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල ගෙවීම් සඳහා බිල්පත් ප්‍රමාදවී ලැබීම හේතුවෙන් බැරකම් වලට ඇතුළත් කර ඇති බව. | අප්‍රමාදව බැරකම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ, බැඳීම් හා බැරකම් ප්‍රකාශනයේ වැය විෂයයන් 26 ක දැක්වෙන ශේෂ, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයේ (එස් ඒ 92) දැක්වෙන ශේෂ සමඟ සැසඳීමේදී රු. 60 සිට රු.5,385,472 දක්වා පරාසයක වෙනස්කම් පැවතුණි. | 2021 ඔක්තෝම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021-02 හි 4.5 ඡේදය අනුව සිගාස් වැඩසටහනට බැරකම් ඇතුළත් කිරීමට ලබා දී තිබූ අවසාන දිනට පසුව ගිණුම් අංශයට බැරකම් ලෙස දන්වා එවා ඇති අගයන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර ඇති නමුත් සිගාස් වැඩසටහනේ ඇතුළත් කර නොමැති බව. | වර්ෂයට අදාල බැරකම් සියල්ල නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැය විෂයන් 04 ක ඉතිරිය ඉක්මවා රු. 6,205,441 ක බැරකම් වලට බැඳී තිබුණි. | අත්‍යාවශය කාර්යන් ඉටු කිරීම සඳහා බැරකම් වලට එළඹීම මෙයට හේතුව බව. | ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට නොඑලඹිය යුතුය. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා පලාත් පාලන ආයතනවලට මාරු වී ගිය නිලධාරීන් හා මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කල සේවය අතහැර ගොස් ඇති, සේවය අවසන් කල නිලධාරීන් 81 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 4,443,564 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීම සඳහා සිහි කැඳවීම් කර දැනුවත් කිරීම් සිදු කර ඇති බව. | ණය අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා බැංකු ආණමඩුව ශාඛාවේ ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම අනුව මාස 06 ඉක්ම වූ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම රු. 249,862 ක් වුවද මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන (viii) අනුව ඉදිරිපත් නොවූ චෙක්පත් යටතේ ශේෂයක් සඳහන්ව නොපැවතුණි. | වැරදීමකින් මහා භාණ්ඩාගාරය විසින් පවරා ගන්න ලද ශේෂය ඇතුළත් කර ඇති අතර ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396 (ඇ) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන කාර්යාලය හා තාක්ෂණ / කාර්මික විද්‍යාල 15 ක නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්ම වූ එකතුව රු. 646,390 ක් වූ චෙක්පත් 53 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ චෙක්පත් පිළිබඳ සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | මාස 6 ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රධාන කාර්යාලයට අයත් බැංකු ගිණුමට අදාල බැංකු සැසඳුමේ 2018 ජූලි සහ 2021 අප්‍රේල් මාසය තුළ තැන්පත් කළ එකතුව රු.349,060 ක් වටිනා තැන්පතු 2 ක් පැවති අතර 2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාල එකතුව රු. 8,980,552 ක් වූ හඳුනා නොගත් ලැබීම් අවස්ථා 302 ක් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනා නොගත් අයිතම හඳුනා ගැනීමට කටයුතු කරනු ලබන බව. | හඳුනා නොගත් ලැබීම් හඳුනා ගැනීමට කටයුතු කිරීමත් , උපලබ්ධි නොවූ තැන්පත් හඳුනාගෙන එම ආදායම නැවත ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 2.5 අවිධිමත් ගනුදෙනු

--------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ ජපානයේ පැවති කාර්මික පුහුණු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන සඳහා සහභාගි වීමට හැකියාව නොමැති නිලධාරියෙකු විදේශගත වීමෙන් සිදු කල වරදට හා මෙම ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා නිලධාරියෙකු තෝරා ගැනීමේදී ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 4 වන වගන්තිය උල්ලංගනය වන අයුරින් වැරදි සහගත ලෙස නිලධාරියෙකු තෝරා යැවීමට කටයුතු කර තිබුණි. ඒ අනුව රාජ්‍ය මුදල් අයතා ලෙස පරිහරණය කිරීමට ඉඩ හැරීම සහ නොසැලකිලිමත් අයුරින් රාජ්‍ය සේවය අපකීර්තිමත් වන අයුරින් කටයුතු කිරීම සම්බන්ධයෙන් එවකට නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) හා කළමණාකරණ සේවා නිලධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 14 වගන්තිය ප්‍රකාරව චෝදනා පත්‍ර නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට 2018 නොවැම්බර් 24 දිනැති මූලික විමර්ෂණ වාර්ථාවේ නිර්දේශ කර තිබුණි. එහෙත් 2022 මැයි 22 වන විටත් එම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම් විසින් අදාල නිලධාරීන්ට ලිඛිතව අවවාද කර ඇති බව. | මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ පරිදි ආයතන සංග්‍රහයේ **XLVIII** වැනි පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ / කාර්මික විද්‍යාල 39 න් විද්‍යාල 15 ක පිහිටි ඉඩම් වල අයිතිය අදාල විද්‍යාල වෙත හෝ දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | විවිධ හේතුන් මත මේ දක්වා පවරා දීම සිදු කර නොමැති බවත් ප්‍රාදේශීය ලේකම්වරු මේ සම්බන්දයෙන් සාදනීය කාර්යභාරයක් ඉටු නොකරන බැවින් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු ගැටලුවක් බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2019 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවල නිර්දේශ කර තිබු අපහරණය කල යුතු වත්කම් වර්ග 2922 ක හා විකිණීම සඳහා නිර්දේශ කර තිබු වත්කම් වර්ග 5432 ක වටිනාකම හඳුනාගෙන පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල භාණ්ඩ වසර ගණනාවකට පෙර ලබාගත් භාණ්ඩ වන අතර ඒවායේ පිරිවැය වටිනාකම සොයා ගැනීමට අපහසුතාවක් පවතින බව. එබැවින් එම වත්කම් තක්සේරු මණ්ඩලයක් මගින් තක්සේරු කර ඉදිරියේදී පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ක්‍රියාත්මක කල යුතුය. |

### 3.2 පාඩු හා හානි

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේ සිට පැවත එන රු. 4,510,469 ක් වටිනා හානි පාඩු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 103 (1) ප්‍රකාරව කටයුතු නොකර අවුරුදු 10 ත් අවුරුදු 2 ත් අතර කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරියට ගෙන එමින් පැවතුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමින් පාඩු හා හානි කපා හැරීමට කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් අදාල කටයුතු කඩිනමින් අවසන් කිරිමට කටයුතු කල යුතු බව . | මුදල් රෙගුලාසි ප්‍රකාරව පාඩු අයකරගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 -2019 කාලය අතරතුරදී රිය අනතුරු 05 කදී සිදු වූ අලාභයෙන්, රක්ෂණ වන්දි නොලද එකතු වටිනාකම වන රු. 208,416 ක මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාව අනුව වගකිව යුතු පාර්ශවයන් වෙතින් අය කරගත යුතු බවට නිර්දේශ කර තිබුණද එම මුදල අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අනතුරු සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් නිකුත් කිරීම සඳහා වූ නිර්ණායකයන් පදනම්ව සකස්කරන ලද කාර්යසාධන නිර්ණායක මත SSDP ව්‍යාපෘතියේ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් 2020 වර්ෂයේ නිලධාරින් නව දෙනෙකුට රු. 1,095,994 ක දීමනාවක් ගෙවා තිබුණ ද ව්‍යාපෘතියේ ප්‍රමුඛ කාර්යයන් කිහිපයක් වන පුහුණුකරුවන්ගේ වෘත්තීමය හැකියාවන් සංවර්ධනය කිරීම , ගුණාත්මක බවින් යුත් කාර්මික සහ වෘත්තීය අධ්‍යාපන පුහුණු වැඩසටහන් ඉහල නැංවීම, නව පාඨමාලා හඳුන්වා දීම හෝ සංශෝධනය කිරීම, වෘත්තීමය ගුරුවරුන්ගේ අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු කිරීම, කාර්මික විද්‍යාලවලට අවශ්‍ය උපකරණ සැපයීම සහ යටිතල පහසුකම් පද්ධතිය වැඩිදියුණු කිරීම වැනි ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සියයට 0 සිට සියයට 41 දක්වා අවම මට්ටමක පැවතුණි. | 65% ක පමණ භෞතික ප්‍රගතියක් ලබා කරගෙන ඇත. කොවිඩ් වසංගත තත්වය හා රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය මත මූලික කටයුතු සැලසුම් කලද ක්‍රියාත්මක කිරීමට අපහසු වූ අවස්ථා පැවතුණු බව. | මෙම ව්‍යාපෘතියේ ප්‍රමුඛ කාර්යන් ඉටු කිරීමෙන් පසු දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 -2019 වර්ෂයන් වලදී හසලක හා හෝමාගම කාර්මික විද්‍යාලයන්හි ආරම්භ කිරීමට සැළසුම් කර තිබූ පාඨමාලා 10 ක් සඳහා ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති වීම හා බාහිර උපදේශකවරුන් අදාල සුදුසුකම් සපුරා නොමැති වීම හේතුවෙන් පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | අධ්‍යන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු හේතුවෙන් බාහිර උපදේශකවරු ලෙස සුදුසුකම් සපුරා ඇති සම්පත් දායකයින් සති අන්තයේ යොදාගැනීමත් විශ්‍රාම ගිය නිලාධාරින් සතියේ දිනවල බාහිර සම්පත් දායකයින් ලෙස යොදාගැනීමෙන් මෙම ගැටලුව අවම කිරීමට කටයුතු කරන බව. | සුදුසුකම් ලත් කථිකාචාර්යවරු බඳවාගෙන සැලසුම් කරන ලද පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | විද්‍යාල 6 ක පාඨමාලාවන්ගේ ගුණාත්මකභාවය ඉහල නැංවීමට අවශ්‍ය හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික උපකරණ හා මෙවලම් වර්ග 19 ක් ප්‍රමාණවත් පරිදි නොපැවතුණි. | රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ මහා භාණ්ඩාගාරය විසින් දෙනලද ප්‍රතිපාදන මත ප්‍රමුඛතාවයන් හදුනා ගෙන අදාල අවශ්‍යතාවයන් ඉටු කිරීමට ක්‍රියා කරන බව. | අත්‍යවශ්‍ය උපකරණ සපයාගෙන පාඨමාලා වල ගුණාත්මක භාවය පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | පාඨමාලාවන් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් පන්ති කාමර පහසුකම් කාර්මික / තක්ෂණ විද්‍යාල 07 ක නොපැවතුණි. | රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ මහා භාණ්ඩාගාරය විසින් දෙනලද ප්‍රතිපාදන මත ප්‍රමුඛතාවයන් හදුනා ගෙන අදාලා අවශ්‍යතාවයන් ඉටු කිරීමට ක්‍රියා කරන බව. | පවතින සම්පත් භාවිතා කර පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරීන්ගේ, දෙපාර්තමේන්තු ගත තනතුරු දරන නිලධාරීන්ගේ හා ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටි විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් විද්‍යාල 09 ක නිලධාරීන් 186 දෙනෙකු එකම සේවා ස්ථානයේ රැඳීසිටින බව නිරීක්ෂණය විය. | මාරු කිරීමේදී එක් එක් කාර්මික/ තාක්ෂණ විද්‍යාලයන් හි ක්‍රියාත්මක වන පාඨමාලාවට අනුකූල වනසේ ස්ථාන මාරු සිදු කළ යුතු අතර සේවා කාලය පමණක් සලකා ස්ථානමාරු කළ හොත් පාඨමාලා අඛණ්ඩව පවත්වාගෙන යාමේ ගැටළුවක් මතුවන බව. | ස්ථාන මාරු පටිපාටි අනුව කටයුතු කල යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | ------------------------- | ------------- |
| (අ) | කුලියාපිටිය, කුරුණෑගල, වාරියපොල කාර්මික විද්‍යාලවල අනුමත කාර්ය මණ්ඩලය වෙනුවෙන් කිසිදු නිලධාරියෙකු අනුයුක්ත නොවූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු | පුරප්පාඩු පිරවීමට අදාල අංශ දැනුවත් කර ඇති බව. | කිසිදු නිලධාරියෙකු අනුයුක්ත නොවූ තනතුරු වෙනුවෙන් අත්‍යවශ්‍ය තනතුරු සඳහා අනුයුක්ත |

| | | | |
|---|---|---|---|
| | 2 ක් ද ද්විතීයික මට්ටමේ තනතුරු 13 ක්ද තෘතීයික මට්ටමේ තනතුරු 5 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 3 ක්ද ලෙස මුළු පුරප්පාඩු 74 ක් පැවතුණි. | | කිරීම් කඩිනම් කිරීම කල යුතුවීම. |
| (ආ) | තාක්ෂණ / කාර්මික විද්‍යාල 16 ක් සඳහා කථිකාචාර්යවරුන් දෙදෙනෙකු හා ලේඛකාධිකාරිවරයකු අනුමතව සිටියද ඒ සඳහා කිසිදු කථිකාචාර්යවරයකු හෝ ලේඛකාධිකාරිවරයකු අනුයුක්තව නොතිබුණි. | සමස්තයක් ලෙස රාජ්‍ය සේවයේ **AO** හිඟතාවයක් පවතී. එතෙක් සිටින නිලධාරීන්ගෙන් එම රාජකාරිය ඉටු කරගනු ලබන බව. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා අනුයුක්ත කිරීම් කඩිනමින් සිදු කිරීමට කටයුතු කල යුතුවීම. |
| (ඇ) | සියලුම විද්‍යාලයන් සඳහා ශිල්ප ප්‍රදර්ශකවරුන් එක් අයෙකු බැගින් 39 දෙනෙකු අනුමතව සිටියද ගාල්ල හා වරකාපොළ විද්‍යාලවල පමණක් සත්‍ය වශයෙන් සේවයේ යොදවා තිබුණි. | ලද අයදුම්පත් අතුරින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා විභාගයක් පැවැත්වීමට කටයුතු සම්පාදනය කරමින් පවති න බව. | අනුයුක්ත කිරීම් කඩිනමින් සිදු කිරීමට කටයුතු කල යුතුවීම. |
| (ඇ) | තාක්ෂණ විද්‍යාල 9 හා කාර්මික විද්‍යාල 30 සඳහා අනුමත උපදේශකවරුන් හා කථිකාචාර්යවරුන් සංඛ්‍යාව පිළිවෙලින් 897 ක් හා 265 ක් වුවද දැනට සිටින සත්‍ය කාර්ය මණ්ඩලය 442 ක් හා 222 ක් විය.පුරප්පාඩු වු කාර්ය මණ්ඩලය 455 ක් වූ අතර. අනුමත සංඛ්‍යාව හා සැසඳීමේ දී පිළිවෙලින් සියයට 65 හා සියයට 85 කට වැඩි ප්‍රමාණයකින් සත්‍ය කාර්යමණ්ඩලයේ පුරප්පාඩු වු විද්‍යාල පිළිවෙලින් 16 ක් හා 4 ක් පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබු බව. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා අනුයුක්ත කිරීම් කඩිනමින් සිදු කිරීමට කටයුතු කල යුතුවීම. . |